# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 10 ගෙවුම් ශේෂ ලේඛනය
## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1) ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම සමන්විත වන්නේ, පහත කවර ගිණුම් වලින්ද?

   (1) භාණ්ඩ හා සේවා ගිණුම, ප්‍රාථමික ආදායම් ගිණුම හා ද්විතියික ආදායම් ගිණුම
   (2) ජංගම ගිණුම, ප්‍රාග්ධන ගිණුම හා මූල්‍ය ගිණුම
   (3) භාණ්ඩ හා සේවා ගිණුම, මූල්‍ය ගිණුම හා ප්‍රාග්ධන ගිණුම
   (4) ප්‍රාග්ධන ගිණුම, සේවා ගිණුම හා ප්‍රාථමික ආදායම් ගිණුම
   (5) ජංගම ගිණුම, සේවා ගිණුම හා ප්‍රාග්ධන ගිණුම

2) අන්තර්ජාතික වෙළෙඳාමේදී රටක් අනෙකුත් රටවල් සමඟ සාධක නොවන සේවා සඳහා කරනු ලබන වියදම් සහ ලැබෙන ආදායම් සටහන් කරන ගිණුම වනුයේ කුමක්ද?

   (1) භාණ්ඩ
   (2) සේවා
   (3) ප්‍රාථමික ආදායම්
   (4) මූල්‍ය
   (5) ද්විතියික ආදායම්

3) සේවා ගිණුමට අයත් නොවන සංරචකයකි,

   (1) මුහුදු ප්‍රවාහන
   (2) ගුවන් ප්‍රවාහන
   (3) මූල්‍ය සේවා
   (4) විදුලි සංදේශ සේවා
   (5) ඇඟළුම්

4) ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුළත් වන්නේ,

   (1) පොළී, වැටුප් හා මූල්‍ය වත්කම් ආයෝජනයෙන් උපයා ගන්නා ලාභාංශ වේ.
   (2) මූල්‍ය වත්කම් හිමි කරගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු වේ.
   (3) ඒකපාර්ශවීයව සිදු කරන ගනුදෙනු වේ.
   (4) ආදායම් ලැබීම් හා ගෙවීම් ආශ්‍රිත ගනුදෙනු වේ.
   (5) සංචාරක, මුහුදු, ගුවන් ප්‍රවාහන ගනුදෙනු වේ.

5) ගෙවුම් ශේෂයේ දීර්ඝ කාලීන හිඟයක් පවතින විට ඉදිරිපත් කළ හැකි විසඳුමක් වන්නේ,

   (1) විදේශ සංචිත යොදා ගැනීමය.
   (2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සමීපස්ථ ණය ලබා ගැනීමය.
   (3) වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් කෙටිකාලීන අරමුදල් ලබා ගැනීමය.
   (4) අපනයන සංවර්ධන කලාප පිහිටුවීමය.
   (5) ආනයන වැඩි කිරීමය.

6) මූල්‍ය ප්‍රතිලාභයන් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයින් වෙනත් රටක ව්‍යාපාරික සමාගම් කොටස්, පිළිණපත්, ණයකර, වාණිජ පත්‍රිකා ආදී මූල්‍ය වෙළෙඳපොල උපකරණ මිලදී ගැනීම හැඳින්වෙන්නේ, පහත කවර කරුණක් ලෙසද?

   (1) විදේශීය සෘජු ආයෝජන
   (2) ගෙවුම් ශේෂය
   (3) කළඹ විදේශ ආයෝජන
   (4) විදේශ වත්කම් මිලදී ගැනීම
   (5) විදේශ සම්පත් මිලදී ගැනීම

7) ගෙවුම් ශේෂ දුෂ්කරතා මඟහරවා ගැනීමට විදේශ ආයෝජන යොදා ගත හැකිය. එය කොටස් දෙකකි. ඒ මොනවාද?

   (1) කළඹ ආයෝජන හා විදේශ සෘජු ආයෝජනයි.
   (2) විදේශ සෘජු ආයෝජන හා සංචාරක කර්මාන්තයි.
   (3) කළඹ ආයෝජන හා විදේශ විනිමය අනුපාතිකයන්ය.
   (4) විනිමය අනුපාතිකයන් හා විදේශ සෘජු ආයෝජනයි.
   (5) අපනයන විවිධාංගීකරණය හා කළඹ ආයෝජනයි.

8) දේශීය මුදලේ විදේශීය අගය පහත හෙලීමෙන් අපේක්ෂා කරනුයේ,

   (1) අපනයනවල මිල වැඩිකොට අපනයන අධෛර්මත් කිරීමයි
   (2) අපනයනවල මිල අඩු කොට අපනයන ධෛර්යමත් කිරීමයි
   (3) ආනයන වියදම වැඩි කර ගැනීමයි
   (4) අපනයනවලට වඩා ආනයන වැඩිකරදීමයි
   (5) ආනයන වියදම අඩු කර ගැනීමයි

9) ජංගම ගිණුමේ හිඟය තීව්‍රවීමට හේතුවන්නේ,

   (1) වෙළෙඳ ගිණුමේ සෘණ අගයක් ගැනීමය.
   (2) ප්‍රාථමික ආදායම් ගිණුමේ සෘණ අගයක් ගැනීම ය.
   (3) වෙළෙඳ හා ප්‍රාථමික ආදායම් ගිණුමේ සෘණ අගයක් ගැනීම ය.
   (4) ද්විතීයික ආදායම් ගිණුමේ ධන අගයක් ගැනීම ය.
   (5) ප්‍රාථමික හා ද්විතීයික ආදායම් ගිණුමේ ගැලපීමය.

10) විදේශ සම්පත් පරතරය හිඟ වූ විට ඇතිවන ආර්ථික ප්‍රතිවිපාකය නොවන්නේ, මින් කවරක්ද?

   (1) ජාත්‍යන්තර ණය අර්බුදවලට පාත්‍ර වීම
   (2) මුදල් සැපයුම පහත වැටීම
   (3) මුදලේ විදේශ අගය පහළ යාම
   (4) විදේශ වත්කම් ප්‍රමාණය පහළ යාම
   (5) විදේශ ණය සේවාකරණ ගෙවීම් පහළ යාම

11) රටකට හිමි විදේශ වත්කම්වල සාපේක්ෂ ප්‍රමාණය රඳා පවතිනුයේ,

(1) විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව කොපමණ කාලයක් සඳහා ප්‍රමාණවත් වේද? යන්න මතය.
(2) විදේශ වත්කම්වල අපනයන ශක්‍යතාව කොපමණ කාලයක් සඳහා ප්‍රමාණවත් වේද? යන්න මතය.
(3) විදේශ වත්කම්වල ආනයන හා අපනයන ශක්‍යතාව කොපමණ කාලයක් සඳහා ප්‍රමාණවත්වේද? යන්න මතය.
(4) මූල්‍ය අධිකාරියට බලපෑම් කිරීමට ඇති හැකියාව මතය.
(5) විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය මතය.

12) විදේශ විනිමය විකුණුම් මිල හා ගැනුම් මිල අතර පරතරය නිරූපණය කරන්නේ, පහත කවරක් මගින්ද?

(1) අපනයන හා ආනයන වෙනස
(2) වාණිජ බැංකු ආයතනයක ලාභාන්තිකය
(3) විදේශ විනිමය ජාවාරම්කරුවන්ගේ ලාභය
(4) මහ බැංකුවේ ලාභය
(5) රජයේ ලාභාන්තිකය

13) ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම සමන්විත වන්නේ, පහත කවර ගිණුම් වලින්ද?

(6) භාණ්ඩ හා සේවා ගිණුම, ප්‍රාථමික ආදායම් ගිණුම හා ද්විතීයික ආදායම් ගිණුම
(7) ජංගම ගිණුම, ප්‍රාග්ධන ගිණුම හා මූල්‍ය ගිණුම
(8) භාණ්ඩ හා සේවා ගිණුම, මූල්‍ය ගිණුම හා ප්‍රාග්ධන ගිණුම
(9) ප්‍රාග්ධන ගිණුම, සේවා ගිණුම හා ප්‍රාථමික ආදායම් ගිණුම
(10) ජංගම ගිණුම, සේවා ගිණුම හා ප්‍රාග්ධන ගිණුම

14) වෙළෙඳාමට පාත්‍ර වන සමාන භාණ්ඩ පැසක වටිනාකම රටවල් දෙකේ දේශීය මුදල් ඒකක වලින් මනිනු ලැබුවහොත් එම අගයන් දෙක අතර අනුපාතය හඳුන්වනුයේ, පහත කවරක් ලෙසද?

(1) සඵල ආරක්ෂණය.
(2) මූර්ත විනිමය
(3) මූර්ත සඵල විනිමය
(4) ස්ථාවර විනිමය.
(5) ක්‍රය ශක්ති විනිමය

15) මූර්ත විනිමය අනුපාතිකයේ ස්වභාවය වන්නේ,

(1) රටවල නාමික විනිමය අනුපාතිකයේ ඉහළ පහළ යාමය.
(2) අදාල රටේ අපනයන තරඟකාරීත්වය මිනුම් කිරීමට දර්ශකයක් වශයෙන් යොදා ගැනීමය.
(3) රටේ උද්ධමන අනුපාතිකය පාලනය කිරීමය.
(4) අපනයන තරඟකාරීත්වය පහළ මට්ටමක පවත්වා ගැනීමය.
(5) උද්ධමන අනුපාතිකයන් අතර වෙනස ගැලපීමය.

# ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය

### බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 1 | (1) |
| 2 | (2) |
| 3 | (5) |
| 4 | (1) |
| 5 | (4) |
| 6 | (3) |
| 7 | (1) |
| 8 | (2) |
| 9 | (3) |
| 10 | (5) |
| 11 | (1) |
| 12 | (2) |
| 13 | (5) |
| 14 | (5) |
| 15 | (2) |

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 10 ගෙවුම් ශේෂ ලේඛනය
## ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1)

(i) "ගෙවුම් තුලන ලේඛනය සැම විටම තුලනය වේ." මින් අදහස් කරන්නේ කුමක්ද?

(ii) ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් ගනුදෙනු කවරේද?

(iii) ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රධාන ගිණුම් 03 දක්වා සේවා ගිණුමට අයත් සංරචක 04ක් ලියන්න.

(iv) පහත ගනුදෙනු ඇතුළත් වන ගිණුම දක්වන්න.

a) ශ්‍රී ලාංකික සමාගමක් මාලදිවයිනේ ඇඟළුම් කම්හලක ආයෝජනයෙන් මිලියන 300ක ලාභාංශයක් ලැබීම.

b) ශ්‍රී ලංකාවේ චීන ජාතිකයින් තම ඥාතීන් වෙත මිලියන 500ක ප්‍රේෂණ චීනයේ බැංකුවක් වෙත යැවීම.

c) ශ්‍රී ලංකාවේ ඇඟලුම් සමාගමක් මිලියන 500ක් වටිනා ඇඟළුම් තොගයක් අපනයනය කිරීම.

d) මැදපෙරදිග සේවයේ නියුතු ලාංකිකයන් තම ඥාතීන්ට මිලියන 1500ක ප්‍රේෂණ වාණිජ බැංකුව වෙත එවීම.

(v) නිෂ්පාදනය නොකළ මූල්‍ය වත්කම් 04ක් ලියන්න.

2)

(i) ගෙවුම් ශේෂයේ හිඟයක් කෙටිකාලීනව මූල්‍යනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ග මොනවාද?

(ii) දීර්ඝකාලීනව ගෙවුම් ශේෂ හිඟයක් සඳහා ඉදිරිපත් කළ හැකි විසඳුම් 04ක් ලියන්න.

(iii) විදේශ සම්පත් පරතරයෙහි හිඟයක් ආර්ථිකයට ඇති කරන අහිතකර ප්‍රතිවිපාක කවරේද?

(iv) රටක විදේශ වත්කම් පවත්වා ගැනීමට කටයුතු කරන්නේ ඇයි?

3)

(i) ඍජු විදේශ ආයෝජනයේ හිතකර ප්‍රතිවිපාක 04ක් ලියන්න.

(ii) කළඹ ආයෝජනය යන්න හඳුන්වන්න.

(iii) විදේශ විනිමය වෙළෙඳපොලේ ක්‍රියාකාරී පාර්ශවයන් කවුරුන්ද?

(iv) විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කරන ක්‍රමයක් වන වක්‍ර කියවීම් යන්න උදාහරණයකින් දක්වන්න.

(v) රටකට ඩොලර් සඳහා ඉල්ලුමක් පවතින්නේ ඇයි?

4)

(i) ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය රටකට අවාසිදායක ලෙස බලපාන්නේ කෙසේද?

(ii) නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයේ වාසි 04ක් ලියන්න.

(iii) නාමික සඵල විනිමය අනුපාතිකය යනු කුමක්ද?

(iv) නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය පහළ අගයක් ගන්නේ ඇයි?

(v) විදේශ විනිමය අනුපාතිකය වෙනස්වීමට බලපාන සාධක මොනවාද?

5)

(i) විදේශ විනිමය අනුපාතික වෙනස් වීමට බලපාන හේතු මොනවාද?

(ii) ලෝක බැංකුවේ අරමුණු 04ක් දක්වන්න.

(iii) විනිමය අනුපාතිකය අවප්‍රමාණයේ අපේක්ෂිත අරමුණු කවරේද?

(iv) විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
# සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 10 ගෙවුම් ශේෂ ලේඛනය
## ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1)

(i) ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් සියලුම ගනුදෙනු සමාන අගයකින් බැර තීරුවක සහ හර තීරුවක සටහන් කළ විට සියලු ගනුදෙනුවල ශුද්ධ ශේෂය ශූන්‍ය අගයක් ගැනීම මින් අදහස් වේ.

(ii)

1. භාණ්ඩ හා සේවා අපනයනය කිරීම හා ආනයනය කිරීමට අදාල ගනුදෙනු
2. ආදායම් ලැබීම් හා ගෙවීම් ආශ්‍රිත ගනුදෙනු
3. වත්කම්, ධනය, ත්‍යාග වැනි දෑ පිළිබඳව ඒකපාර්ශවීයව සිදු කරන ගනුදෙනු
4. නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හිමිකර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු

(iii) **ප්‍රධාන ගිණුම් 03**

1. ජංගම ගිණුම
2. ප්‍රාග්ධන ගිණුම
3. මූල්‍ය ගිණුම

**සේවා ගිණුමට අයත් සංරචක**

1. සංචාරක සේවා
2. මුහුදු ප්‍රවාහන
3. ගුවන් ප්‍රවාහන
4. මූල්‍ය සේවා
5. රක්ෂණ සේවා
6. විදුලි සංදේශ සේවා

(iv)

a) ප්‍රාථමික ආදායම් ගිණුම
b) ද්විතීයික ආදායම් ගිණුම
c) භාණ්ඩ ගිණුම
d) ද්විතීයික ආදායම් ගිණුම

(v) බලපත්‍ර, බදු ගිවිසුම්, සන්නම්, කීර්තිනාමය විකිණීම/ මිලදී ගැනීම, පේටන්ට් බලපත්‍ර, පුරස්කාර

2)

(i)

1. විදේශ සංචිත යොදා ගැනීම
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සමීපස්ථා ණය ලබා ගැනීම
3. වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් කෙටි කාලීන අරමුදල් ලබා ගැනීම

(ii)

1. අපනයන විවිධාංගීකරණය
2. සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
3. සාම්ප්‍රදායික අපනයනය දිරිමත් කිරීම
4. අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
5. විදේශ රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම
6. විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ හැරීම හෝ අවප්‍රමාණය කිරීම

(iii)

1. විදේශ වත්කම් ප්‍රමාණය පහළ යාම
2. විදේශ ණය ගැනීමට සිදු වීම
3. මුදලේ විදේශ අගය පහළ යාම
4. මුදල් සැපයුම පහත වැටීම
5. ජාත්‍යන්තර ණය අර්බුදවලට පාත්‍රවීම

(iv)

1. මුදලේ විදේශ අගය  ස්ථාවරව පවත්වා ගෙන යාමට
2. මුදල් සැපයුම තීරණය කිරීමට
3. ආනයන ශක්‍යතාව පරීක්ෂා කිරීමට
4. ගෙවුම් ශේෂ හිඟය පියවීමට
5. විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීමට

3)

(i)

1. ණය බර ඉහළ නොයාම
2. ගෙවුම් ශේෂ හිඟයට පිළිතුරක් වීම
3. නව තාක්ෂණය හා කළමනාකරණය රටට ලබා ගත හැකි වීම
4. විදේශ විනිමය පරතරය පියවා ගැනීමට හැකි වීම
5. සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ඉහළ යාම
6. අමතර ප්‍රාග්ධනය තුළින් සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ඉහළ යාම

(ii) මූල්‍ය ප්‍රතිලාභයන් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයින් වෙනත් රටක ව්‍යාපාරික සමාගම් කොටස්, පිළිණපත්, ණයකර, වාණිජ පත්‍රිකා ආදී මූල්‍ය වෙළෙඳපොල උපකරණ මිලදී ගැනීම.

(iii) වාණිජ බැංකු, විදේශ විනිමය තැරැව්කරුවන්, ව්‍යාපාරික ආයතන, මහ බැංකුව, මහජනතාව, ආණ්ඩුව

(iv) දේශීය මුදල් ඒකකයේ මිල විදේශ ව්‍යවහාර මුදල් ඒකක මඟින් දැක්වීමයි.

උදා: ශ්‍රී ලංකා රුපියල් 1 = එක්සත් ජනපද ඩොලර් $\frac{1}{350}$ = 0.00285

(v) රටකට ඩොලර් සඳහා ඉල්ලුමක් පවතින්නේ,

1. විදේශ රටවලින් භාණ්ඩ ආනයනය කිරීමට
2. විදේශ රටවල සංචාරය කිරීමට
3. ණය ආපසු ගෙවීමට
4. ණය සඳහා පොළිය ගෙවීමට
5. විදේශ රටවලට සංක්‍රාම ගෙවීමට

4)

(i)

1. ගෙවුම් ශේෂ හිඟයක් ඇතිවුවහොත් එය සමනය කර ගැනීමට අභ්‍යන්තර ආර්ථිකයේ අවධානයක් ඇති කරගැනීමට සිදු වීම.
2. ස්ථාවර විනිමය අනුපාතිකයේ අධි තක්සේරුවක් හෝ ඌණ තක්සේරුවක් පැවතුනහොත් එය ගෙවුම් ශේෂ හිඟයක් හෝ අතිරික්තයක් ඇති වීමට හේතු වේ.
3. ගෙවුම් ශේෂ හිඟය පියවීමට විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගෙන යාමට සිදුවීම.
4. ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට සිදු වීම විවෘත වෙළෙඳාමෙන් ලැබිය හැකි සුභසාධනය අඩු වීම.

(ii)

1. විදේශීය විනිමය ඉල්ලුම හා සැපයුම සමාන කෙරෙන සමතුලිත විනිමය අනුපාතිකයක් බැවින් විනිමය අනුපාතිකය අධි තක්සේරු වීමටත් ඌණ තක්සේරු වීමටත් ඉඩක් නොමැත.
2. ගෝලීය ආර්ථික සම්පත් විකල්ප භාවිතයන් අතර වඩාත් කාර්යක්ෂම ආකාරයට බෙදී යයි
3. මූල්‍ය ප්‍රතිපත්ති නිදහසේ යොදා ගත හැකි වීම.
4. ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු නොවන බැවින් විවෘත වෙළෙඳාම මඟින් සමාජ සුභ සාධනය උපරිම වශයෙන් භුක්ති විඳිය හැක.

(iii) ශ්‍රී ලංකාව සමඟ විදේශ වෙළෙඳාමේ යෙදෙන ප්‍රධාන රටවල් 24හි නාමික විනිමය අනුපාතිකයන් මත එම රටවල් අතර ඇති වන විදේශ වෙළෙඳාමේ ප්‍රමාණය මත බර තබා ගණනය කළ හැකි බරිත සාමාන්‍ය විනිමය අනුපාතිකයයි.

(iv) රටේ උද්ධමන අනුපාතිකය වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමන අනුපාතිකයට වඩා අඩු බවයි. එයින් තහවුරු වන්නේ මෙරටේ අපනයන තරඟකාරීත්වය ඉහළ මට්ටමක පවතින බවයි.

(v)

1. ජාත්‍යන්තර වෙළෙඳාම
2. ප්‍රාග්ධන සංචලන
3. මිල සංචලනය
4. සමපේක්ෂණය
5. ආර්ථික ශක්තිය
6. රාජ්‍ය ප්‍රතිපත්ති
7. දේශපාලනික තත්ත්වය

5)

(i)

1. අන්තර්ජාතිකව ගනුදෙනු සිදු කරන රටවල භාණ්ඩ හා සේවාවල මිල මට්ටම වෙනස් වීම.
2. විදේශ විනිමය එක් රැස් කිරීම හා විකිණීම මත
3. රාජ්‍ය ප්‍රතිපත්තිවල විනිමය ප්‍රතිපත්ති ලිහිල් කිරීම නිසා ඒ රට තුළට ගලා එන විනිමය සැපයුම ඉහළ යාම හා පහළ යාම.
4. කොටස් වෙළෙඳපොල සක්‍රීය වීම විනිමය සැපයුම ඉහළ යාම හා පහළ යාම.
5. දේශපාලන ස්ථාවර වීම සහ අස්ථාවර වීම.

(ii)

1. සාමාජික රටවල නිෂ්පාදන කටයුතු සඳහා පහසුකම් සැපයීම.
2. විදේශ පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
3. රටවල ඵලදායී නිෂ්පාදන කටයුතු සඳහා දිගු කාලීන ණය සැපයීම.
4. කාර්මික හා ශිල්පීය උපදෙස් සේවා ලබා දීම.

(iii)

1. ගෙවීම් තුළන ලේඛනයේ දිගුකාලීන හිඟය අවම කිරීම
2. ආනයන ඉල්ලුම අධෛර්යමත් කිරීම
3. අපනයන සැපයුම ධෛර්යමත් කිරීම
4. සේවානියුක්තිකයන්ගේ ප්‍රේෂණ දිරිමත් කිරීම
5. විදේශ ඍජු ආයෝජන ඉහළ නැංවීම

(iv)

1. ආනයනවල දේශීය මිල ගණන් පහළ යාම
2. උද්ධමන අනුපාතිකය පහළ යාම
3. විදේශීය ණයවල දේශීය මූල්‍ය වටිනාකම පහළ යාම
4. විදේශීය ණය ආපසු ගෙවීමේ පිරිවැය අඩු වීම
5. වෙළෙඳ ශේෂය කෙරෙහි අහිතකර බලපෑම

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."